**මහනුවර ඇසළ පෙරහැර භාරය - 2015**

**------------------------------------------------**

මහනුවර ඇසළ පෙරහැර භාරයේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1980 අංක 34 දරන මහනුවර ඇසළ පෙරහැර භාරය පනතේ 16(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2) සී වගන්තිය ප්‍රකාර භාරයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**-------------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්වය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස භාරයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත්, භාරයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**2. මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**2.1 මතය**

**-------**

මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට මහනුවර ඇසළ පෙරහැර භාරයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත්

ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම පිළිබඳව වගකීම් ප්‍රකාශනය මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළිගත් ආකෘතියට අනුව සකස් කර නොතිබුණි.

**2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත දැක්වෙන අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| **නීති රීති හා රෙගුලාසි යනාදියට යොමුව** | **අනුකූල නොවීම්** |
|---|---|
| (අ) 1980 අංක 34 දරන මහනුවර ඇසළ පෙරහැර භාරය පනත | |
| (i) 8 (1) වගන්තිය | ශ්‍රී දළදා මාළිගාවේ දියවඩන නිළමේ, සතර මහා දේවාලවල බස්නායක නිලමේවරුන් සතර දෙනා, මහනුවර පරිපාලන දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්වරයා සහ ජනාධිපතිවරයා විසින් නම් කරනු ලබන සාමාජිකයින් තිදෙනෙකු ගෙන් සමන්විත උපදේශක කමිටුවක් පත් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ii) 16 (3) වගන්තිය | මණ්ඩලය විසින් වාර්ෂිකව භාරයේ වැඩ කටයුතු පිළිබඳ වාර්තාවක් පිළියෙල කොට විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත්, 2015 වර්ෂයට අදාළ වාර්තාව 2016 මාර්තු 21 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. |
| (iii) 19(3) වගන්තිය | බලයලත් නිලධාරියා විසින්, පෙරහැර නැරඹීමේ කාර්ය සඳහා ආසන පැනවීමට බලපත්‍ර ලබාදීමේ දී, ආසන සඳහා අයකරනු ලබන ගාස්තුව හෝ අයකිරීම අධික හෝ අසාධාරණ ද යන්න සැලකිල්ලට ගත යුතු වුවත්, භාරය විසින් එම ගාස්තු හෝ අයකිරීම් පිළිබඳ අවධානය යොමු නොකොට බලපත්‍ර ලබා දී තිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 756 | සමාලෝචිත වර්ෂය වෙනුවෙන් භාණ්ඩ සමීක්ෂණයක් පවත්වා නොතිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව සමාලෝචිත වර්ෂයේ මහනුවර ඇසළ පෙරහැර භාරයේ මූල්‍ය ප්‍රතිඵලය රු.116,613ක ඌනතාවයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.1,805,456ක් වූයෙන් ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,922,069ක පිරිහීමක් දක්නට ලැබුණි.

සමාලෝචිත වර්ෂයේදී දළදා මාළිගාවට ආධාර කිරීම් රු. 500,000 කින් අඩුවීම හා ජනාධිපති ලේකම් කාර්යාලයේ ආධාර ලැබීම් රු. 1,362,500 කින් වැඩිවීම සිදු වී තිබුණද ආසන ආදායම රු.1,897,800කින් අඩුවීම, මහා භාරකාර තැන්පතු පොළී ආදායම රු.632,000 කින් අඩුවීම සහ නැටුම් ශිල්පීන්ට ගෙවීම් රු.1,262,500කින් වැඩිවීම ඉහත පිරිහීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්ය සාධනය**

1980 අංක 34 දරන මහනුවර ඇසළ පෙරහැර භාරය පනතට අනුව භාරයේ අරමුණු පහත දැක්වේ.

* වාර්ෂික ඇසළ පෙරහැර පැවැත්වීම පිණිස ශ්‍රී දළදා මාළිගාවට සහ සතර මහා දේවාලවලට මුදල් සහ වෙනත් ආධාර සැලසීම.
* පෙරහැරේ කලාත්මක සහ සංස්කෘතික අගය නංවාලන ජාතික කලා සහ නැටුම් දිරිගැන්වීම සහ ප්‍රවර්ධනය කිරීම.
* යම් කලාකරුවන්ගේ සහ ශිල්පීන්ගේ සේවා නිසා පෙරහැරේ සංස්කෘතික සහ කලාත්මක අගය වැඩිදියුණු විය හැකිද ඒ කලාකරුවන්ට සහ ශිල්පීන්ට මුදල් ආධාර සැලසීම.
* පෙරහැරේදී උපයෝගී කරගතයුතු භාණ්ඩ නිෂ්පාදනයේ නිරත වීම.
* පෙරහැරට සහභාගි වන කලාකරුවන් සහ නැටුම්කරුවන් සඳහා තරඟ පැවැත්වීම සහ ඔවුන්ට ත්‍යාග, සහතික සහ වෙනත් ආකාරයේ සම්මාන ප්‍රදානය කිරීම.

(අ) ඉහත සඳහන් අරමුණුවලින් පහත දැක්වෙන අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

i. මහනුවර වාර්ෂික ඇසළ පෙරහැරේ කලාත්මක සහ සංස්කෘතික අගය නංවාලන ජාතික කලා සහ නැටුම් ප්‍රවර්ධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

ii. මහනුවර වාර්ෂික ඇසළ පෙරහැරේදී උපයෝගී කරගතයුතු භාණ්ඩ නිෂ්පාදනයේ නිරත වී නොතිබුණි.

(ආ) භාරය පනතේ 19(1) උපවගන්තියට අනුව බලයලත් නිලධාරියා විසින් නිකුත් කරනු ලැබූ බලපත්‍රයක අධිකාරිය යටතේ හැර සහ එහි දක්වා ඇති කොන්දේසිවලට අනුකූලව හැර අන්‍ය ආකාරයකින් කිසිම තැනැත්තෙකු විසින් මහනුවර වාර්ෂික ඇසළ පෙරහැර නැරඹීමේ කාර්ය සඳහා ගාස්තුවක් අයකිරීමක් හෝ යම් පහසුකමක් සඳහා විධිවිධාන සැලසීම නොකළ යුතු

වුවත් එසේ බලපත්‍ර ලබා නොගෙන ආසන පැනවූ පුද්ගලයින්ට විරුද්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් භාරය විසින් ගෙන නොතිබුණු අතර, පනතේ 19 වගන්තියේ (4) උපවගන්තිය පරිදි අයකරනු ලැබිය යුතු ගාස්තුව හෝ අයකිරීම සම්බන්ධයෙන් කොන්දේසි නොපැනවීම හේතුවෙන් බාහිර පාර්ශවයන් විසින් විශාල ලෙස ආදායම් උපයාගෙන ඇති බව නිරීක්ෂණය විය.

(ඇ) රුජිණ හෝටලයේ කොරිඩෝව බදු දීමේ දී බදු ගැනුම්කරු විසින් පෙරහැර නරඹන්නන් සඳහා නිකුත් කිරීමට මුද්‍රණය කරනු ලබන සියළුම ප්‍රවේශ පත්‍ර ගභවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් වෙත ඉදිරිපත් කර, මුද්‍රා තබා ගෙන, ආදායමින් සියයට 25 ක ගාස්තුවක් පෙරහැර භාරයට ගෙවා නියමිත බලපත්‍රයක් ලබාගත යුතු බවට, මහනගර සභාව හා රුජිණ හෝටලයේ කොරිඩෝව බදු ගත් බදුකරුවන් අතර ඇති කර ගත් බදු ගිවිසුමේ බදු කොන්දේසි ලෙස පනවා තිබුණද, එම කොන්දේසි පරිදි පෙරහැර භාරය කටයුතු කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලනය

----------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින් වර භාරයේ සභාපතිවරයා වෙත යොමු කරන ලදී. එලදායී මූල්‍ය පාලන කාරකයක් වශයෙන් අයවැය ලේඛනය යොදා ගැනීම කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.